
සටහන
*ප්‍රදීප් සාරංග කුමාර*
පළමු වසර - විද්‍යාපති (වාස්තු විද්‍යා)
මොරටුව සරසවිය

# නැවත භාවිතය, අඩු වියදම සහ අල්පේච්ඡතාව එක්තැන් වූ නිවහනක්

ගෘහ නිර්මාණය (House Designing) වාස්තු විද්‍යා විෂයෙහි (Architecture) එන එක් නිර්මාණ විශේෂයකි. එහෙත් එය සමාජයේ කෙතරම් වැදගත් ස්ථානයක් අත්කර ගෙන ඇත්දැයි කියතොත් අදට ද වාස්තු විද්‍යාඥයින් (Architects) සාමාන්‍ය මිනිසුන් විසින් හඳුන්වනු ලබන්නේ ගෘහ නිර්මාණ ශිල්පීන් වශයෙනි. එම ව්‍යවහාරයේ ඇති වැරදි සහගත බව කොතරම්ද යන්න පහදා දිය හැකි වුවත් සමාජය තුල **"නිවස"** ට හිමි ආස්ථානය පහත හෙළීමට අපට හැකි නොවේ. එයට මූලිකම හේතුව **"නිවස"** මිනිසාගේ මූලික අවශ්‍යතා තුනෙන් එකක් වීමයි. මේ හේතුව නිසාම වාස්තු විද්‍යාඥයින් මුහුණ දෙන ප්‍රධාන ගැටළුවක් තිබේ. එනම් නිවසක් සඳහා දැරිය හැකි උපරිම පිරිවැය තුළ කලාකෘතියකට ඇති ඉඩකඩ කොපමණ ද යන්නයි. **"අතේ ඇති මුදලට හිතේ හැටියට නිවසක්"** යන්න සිහිනයක් වී ඇත්තේ වෙනත් කරුණක් නිසා නොව **"උද්ධමනය"** නිසාය. එය සෘණාත්මක අදහසක් නොව පවතින යථාර්ථයයි. මේ කරුණු කෙසේ වෙතත් අවාසනාවකට මෙන්, වාස්තු විද්‍යාඥයෙකුට සිය නිර්මාණය සඳහා සියලු අමුද්‍රව්‍ය සපයා ගත හැකි වන්නේ ජීවත් වීම යුද්ධයක් බවට පත් වූ මේ සංකීර්ණ සමාජය තුළින්ම ය.



මේ පසුබිමෙහි ගැවසෙන අපට වරලත් වාස්තු විද්‍යාඥ සාගර ජයසිංහ අතින් නිමවුණු අපූරු නිර්මාණයක් හමුවෙයි. එය මේ පරිභෝජනවාදී සමාජය තුළ භාරගත් එක්තරා අන්දමක අභියෝගයකි. මේ ඔහුගේ වාසය සඳහා ම තනාගත් නිවහන වීම තවත් විශේෂත්වයකි. මේ නිවහනේ විශේෂතා මතුකර දැක්වීමට ප්‍රථම නිවස පිළිබඳ කෙටි හැඳින්වීමක් දක්වමි.

මේ දෙමහල් නිවස පිහිටා ඇත්තේ පානදුර නගරාසන්නයේ, දිබ්බැද්ද පාරේ ගාලුපාර පෙනෙන මානයේය. (ගාලු පාරේ ශබ්දය නිවස අසලට හොඳින් ඇසේ.) පර්චස් 10 ක් තුළ තනා ඇති නිවසේ ඉඩකඩ පිරිමසා ගැනීම අත්‍යාවශ්‍ය කරුණක් වන්නට ඇත. සාගර ජයසිංහ මහතා ස්වකීය කාර්යාලය (ඔහුගේ වචනයෙන් Workshop එක) පවත්වාගෙන යන්නේ ද එහිම ය.

මේ නිවස අනෙක් නිවෙස් වලින් වෙනස් වන්නේ කෙසේද? එය එක්තරා අන්දමක අත්හදා බැලීමක් වැනිය ; අනෙක් අතින් ආදර්ශයකි. මුළු නිවසම **"අඩු වියදම"** (Low Cost), නැවත භාවිතය (Re use) සහ අල්පේච්ඡතාව (Minimalism) යන මූලික සංකල්ප තුන මත ගොඩනැගී ඇතැයි මට සිතේ.

අඩු වියදම් නිවාස (Low Cost Houses) කියා දෙයක් නොමැති බවට ද එක්තරා අදහසක් ඇත. ඒ සියලු මනුෂ්‍යයාට ම සමාන සැප පහසුකම් ලැබීමේ අයිතියක් ඇත යන සංකල්පය උඩය. අඩු වියදම් නිවාස පිළිබඳ අත්හදා බැලීම් වාස්තු විද්‍යාඥයන් අතින් සිදුවන්නේ අවම මට්ටමකිනි. ශ්‍රී ලංකාව වැනි රටක පොදු ජනයා උදෙසා වාස්තු විද්‍යාඥයින්ගේ දායකත්වය අඩු වන්නේ වාස්තු විද්‍යාව ධනවත් මිනිසුන්ට මෙහෙකරන්නක් ය යන මතය ශක්තිමත් කරමිනි. එහෙත් දැන් දැන් වාස්තු විද්‍යාඥයින් සාමාන්‍ය මැද පංතිය තුළ සිය සේවාවන් සපයනු පෙරට වඩා වැඩිපුර පෙනේ. මෙයට ද හේතු ගණනාවක් ඇතත් මේ තත්ත්වය යහපත් එකකැයි සැලකිය යුතුය. අඩු වියදම් නිවාස පිළිබඳ අත්හදා බැලීම් ඉදිරියේදී මීට වඩා අවශ්‍ය වේ යැයි උපකල්පනය කළ හැකිය. සාගර ජයසිංහ වැනි වාස්තු විද්‍යාඥයෙකුට මේ සඳහා සිය දායකත්වය නොඅඩුව සැපයීමට සිදුවනු ඇත. ඒ සඳහා ඔහුට ඇති හැකියාව ගැන මේ නිවසින් ද උදාහරණ සපයා ගත හැකිය.

ඉඩමේ හරි අඩක පමණ ඉදිකර ඇති මේ දෙමහල් නිවසේ දෙපසින් මායිම් මත ඇති බිත්ති දෙකකි. (Blind Walls) පහත මාලයේ ගරාජය, සාලය, කෑම කාමරය, මුළුතැන්ගෙය සහ පැන්ට්‍රිය මෙන්ම කාර්යාලය ද වෙයි. නිවස ඉදිරියෙන් දිවෙන මාර්ගයේ ද බස් ගමනාගමනය සිදුවන බැවින් නිවස තරමක් පිටුපසට ගෙන (Set back) තනා ඇත්තේ ඉදිරිපස කුඩා ගෙළයනක් තැනෙන පරිදිය. (Front garden) සාලය සහ කෑම කාමරය නිවසේ පිටුපසට ගෙන ඇත්තේ ඉඩමේ පිටුපස අවකාශයට (Rear Space) හා බැඳෙන පරිදිය. විශේෂ උත්සව අවස්ථාවලදී සාලයත් කෑම කාමරයත් පිටුපස ගෙළයනත් අවකාශමය වශයෙන් එකමුතු වී වැඩ කරයි. සාලයක් කෑම කාමරයත් පිටුපසට වන්නට පිහිටීමේ අනිවාර්ය අවශ්‍යතාව මත මුළුතැන්ගෙයත් පියගැටපෙළත් නිවසේ ඉදිරිපස කොටසට වන්නට පිහිටා ඇත. නිවසට ඇතුළුවන්නේ පියගැටපෙළෙහි "Landing" කොටසට යටිනි. තමන් නිවසට ඇතුළුවූයේ මුළුතැන්ගෙයටත් නාන කාමරයටත් අතරින් බව කිසිවෙකුට නොහැඟෙයි. කාර්යාලයට යාබද ඒ නාන කාමරයට, අහසට ඇරුණු කුඩා ඉඩ කොටසක් (Open to sky space / small court yard) මඟින් වාතාශ්‍රය සැපයෙන අතර එය අමුත්තන් සඳහා ද භාවිතා කළ හැකි වන සේ පිහිටුවා ඇත. කුඩා කාර්යාලය ඉදිරිපසින් කුඩා මිදුලකට විවෘත වී ඇත. එය ප්‍රධාන මිදුලෙන් වෙන් කරගත් කුඩා මිදුලකි. ප්‍රධාන දොරටුවට වම්පසින් පිහිටි දොරටුවක් කාර්යාලයට පිවිසුම ලබාදෙන අතර අනියම් පිවිසුමක් ලෙස සාලයෙන් ද දොරටුවක් ඇත.

නිවස මධ්‍යයට වන්නට පිහිටි පියගැටපෙළ නැඟ ඉහල මාලයට පිවිසි විට ප්‍රධාන නිදන කාමරයත් (Master bed room) කුඩා ළමුන්ගේ නිදන කාමරයත් අමුත්තන්ගේ නිදන කාමරයත් හමුවේ. ප්‍රධාන නානකාමරයට මෙන්ම කුඩා ළමුන් සඳහා වෙනම සැකසුණු නාන කාමරයක් සඳහා ද ඉඩකඩ පිරිමසා ගෙන තිබේ. ඊට අමතරව නිවසේ ඉදිරිපස දෙසට යොමු වූ සඳළුතලයක් (Balcony) ද වෙයි.

නිවස සරල පෙළ වහලකින් සෙවණ වෙයි. එය දැවමය සැකිල්ලක් මත ඇස්බැස්ටෝස් ඇතිරීමෙන් තැනූ සාමාන්‍ය වහලකි. සිවිලිම වහලේ ආනතිය ම ගෙන පරාල පෙනෙන පරිදි නිමකළ තිබේ. එය නිවසේ ඇතුළතට පමණක් යොදා ඇති අතර වහලේ පිටත කොටස් (eves) සඳහා ඇස්බැස්ටෝස් තහඩුවේ යටි පැත්තට සුදු වර්ණය ද පරාල වලට කළු වර්ණය ද යෙදීමෙන් වියදම අඩුකර තිබේ. සමස්තයක් ලෙස නිවසේ මූලික හැඩයත් (Form) සරල වහලත් නිසා වියදම් අඩු වී ඇතැයි කිව හැකිය. ඊට අමතරව ඇතුළු බිත්ති ද ඇතුළුව සියලු බිත්ති රළු කපරාරුවෙන් (Rough finish) නිමකර තිබීම ද අවම ගෘහ භාණ්ඩ භාවිතය ද මේ සඳහා දායක වී ඇත.


**"නැවත භාවිතය"** පරිසර දූෂණය අවම කිරීමේ එක්තරා සංකල්පයකි. **"භාවිතය අවම කිරීම"** (Reduse) සහ **"ප්‍රතිචක්‍රීයකරණය"** (Recycling) යනු මේ සමඟ අත්වැල් බැඳගත් අනෙක් සංකල්පයයි. එහෙත් වාස්තු විද්‍යාත්මක නැවත භාවිතය (Architectural Reuse) තවත් මඳක් සංකීර්ණ වෙයි. එය ඍජු නැවත භාවිතය (Direct Reuse) සහ වක්‍රාකාර නැවත භාවිතය (Indirect Reuse) ලෙස ආකාර දෙකකි. ද්‍රව්‍ය නැවත භාවිතය (Material Reuse) සහ සංකල්ප භාවිතය (Concept Reuse) යනුවෙන් තවත් ආකාර දෙකකි. ඍජු සහ වක්‍රාකාර යන දෙවිදියේ ම නැවත භාවිතාවන් මේ නිවස තුළ දැකිය හැකි අතර සංකල්ප නැවත භාවිතයට වඩා ද්‍රව්‍ය නැවත භාවිතය කැපී පෙනේ. නැවත භාවිතයේ දී පැරණි දොර ජනෙල් යොදා ගෙන ඇති ආකාරය දර්ශනීය ය. විවිධ ස්ථානවලින් සොයාගත් දොර පියන්, ජනෙල් පියන් ආදිය එක්තැන් කොට තනි නිර්මාණයක සාමාජිකයින් බවට පත්කර තිබේ. බැලූ බැල්මට ඒවා අතර වෙනස්කමක් නොපෙනේ. සියුම්ව බැලූ විට වෙනස්කම් දැකිය හැකි වෙතත් දක්ෂ නිර්මාණකරුවෙකු අතින් විවිධත්වය ඒකත්වයක් (Unity) බවට පත්කර ඇති අයුරු විශිෂ්ටය.

දොර ජනෙල් සඳහා යොදාගෙන ඇති ආකාරයේ ම දොර පියන් සහ ජනෙල් පියන් වෙනත් භාවිතාවන් හි යොදවා තිබීම ද අපූරුය.







*දොර පියන් දෙකක් භාවිතා කර තනා ඇති හැකිලිය හැකි බෙදුම්කඩ (Foldable dry partition) සාලය සහ කෑම කාමරය අර්ධ වශයෙන් වෙන්කර පෙන්වයි. එය ගෘහ අලංකරණයක් ලෙස භාවිතාවන අතර ම හකුලා තැබූ විට තනි අවකාශයක් ලෙස හැසිරීමට සාලයටත් කෑම කාමරයටත් ඉඩ දෙයි.*




UPPER FLOOR PLAN



GROUND FLOOR PLAN


SECTION


FRONT ELEVATION

ගෙබිම සකස්කර ඇත්තේ සාමාන්‍ය සිමෙන්තියෙනි. ඒ මත අර්ථවත් ලෙස එබ්බ වූ පිහන් ගඩොල් ද වැඩබිම් වලින් ඉවත දැමූ ඒවාය. හොඳින් බැලුව හොත් ඒවායේ ඇතැම් මුල්ලක් කැඩී ගොස් ඇති අයුරු හඳුනාගත හැකිය. අපේ ජීවිතය ද මෙබඳු නොවේ ද ? පරිපූර්ණත්වය (The perfection) ඇත්තේ කොතැන ද ? සුන්දරත්වය යනු පරිපූර්ණත්වයම නොවෙයි. බොහෝ මුදල් ඇති අය සිතන්නේ ගෙබිම අලංකාර කිරීමට නම් මුළු නිවසේම පිහන් ගඩොල් ඇතිරිය යුතු බවය. එහෙත් චමත්කාරය දැනවිය හැකි තවත් සරල ක්‍රම තිබේ. එයට අපූරු නිදසුනක් වන මේ නිවසේ නාන කාමර තුළත් මුළුතැන්ගෙය තුළත් බිත්ති මත තනාගත් රූ රටා ද ඉවත ලූ පිහන් ගඩොල් නිර්මාණශීලීව සංඝට්ටනය කොට තැනූ ඒවාය.

වෙනත් අලංකරණ සඳහා ද විවිධ ස්ථානවලින් සපයාගත් පැරණි අංගෝපාංග යොදා තිබේ. සෘජු භාවිතයෙහි මෙන්ම වක්‍ර භාවිතයෙහි ද යොදාගෙන ඇති පැරණි ගොඩනැගිලිවල කොටස්, මූර්ති ආදී දෑ නිවසේ නොඑක් තැන්වල සිට අලංකාරත්වය සදයි. ඉතා අඩු වීදුරු භාවිතයත් නිවසේ පරිසර හිතකාමී ගුණාංගය වැඩි කිරීමට උදව් වී ඇත. දැවයෙන් නිමකළ විශාල වාසිදුරු සහ වීදුරු ගඩොල් (Glass Bricks) හරහා ලැබෙන ආලෝකයෙන් දහවල් කාලයේ නිවස ප්‍රමාණවත් පරිදි එළිය වෙයි.











නිවසේ වර්ණ භාවිතය ද එක්තරා තනි අදහසක් වටා ඒකරාශී වන බව පෙනේ. නැවත භාවිතයට ගැනීමේදී පැරණි දොර ජනෙල් පොලිෂ් කර නැති අතර අතින් වර්ණ ගන්වා (Hand painting) තිබේ. ඒවායේ නිල්පැහැයත් සමස්තයක් ලෙස සුදු පැහැයත් නිවසෙහි දක්නට ලැබේ. පිටත බිත්ති සඳහා ද ඇසට සෞම්‍යය ගෙන දෙන අවම තානයන් (toned down) භාවිතා කර තිබේ. ඇතුලත බිත්ති ද පහතමාලයේ සිවිලිම ද සඳහා යොදාගත් සුදු පැහැය නිවස තුළ ඉඩකඩ වැඩිකර පෙන්වන අතර ම නිවසට ශාන්ත පෙනුමක් එක්කරයි.

*නිවස පුරා දක්නට ලැබෙන මේ අල්පේච්ඡ ගුණය (Minimalistic quality) බුදු දහමින් මෙරටට දායාද වූවක් සේ සැලකේ. එකල එය හුදී ජනයාගේ ජන ජීවිතය හා බද්ධ වුණු සංකල්පයක් වුණු අතර එක්තරා වකවානුවකදී පැතිරී ගිය පරිභෝජනවාදයත් සමග යටපත් විණි. එය මෑත කාලය වන විටත් භාවිතයට ගැණුනේ ඉහල පන්තියේ විලාසිතාවක් ලෙස බව පෙනේ. එහෙත් ඉදිරි කාලයේ එය කවර ආගමකට හෝ විලාසිතාවකට හෝ අයත් වූවක් නොව ජීවිතය නම් දහම හා බැඳුණු දෙයක් බව ඔප්පු කිරීමට මෙවැනි නිමැවුම් හරහා හැකියාව ලැබේවා යි ප්‍රාර්ථනා කරමු.*



වාස්තු විද්‍යාඥ සාගර ජයසිංහ
AIA (SL)
M.Sc.(Arch.), B.Sc.(BE)Hons.